# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/36 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග හදිසි අවස්ථා (රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ සේවකයින්ගේ අවම මාසික වේතන ප්‍රමාණය පිළිබඳ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝගවල කාර්යයන් සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේය.

(2) මෙම නියෝගවලින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත එම බලධරයා විසින් පවරනු ලැබිය හැකිය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇතද මෙම නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතුය ; තව ද, ඒ අනුව එම විධිවිධාන හා ඒ වෙනත් නීතියක් හෝ ගිවිසුමක් හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවක ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා එම නොගැලපීමේ ප්‍රමාණයට එම විධිවිධාන බලපැවැත්විය යුතුය.

4. කම්කරුවන් එක් සියයකට නොඅඩු සංඛ්‍යාවක් සේවයේ යොදවනු ලබන, රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ සෑම සේවායෝජකයකු විසින් ම එක් එක් නුපුහුණු කම්කරුවකු මාසය තුළ යටත් පිරිසෙයින් දින විසිපහක්වත් වැඩ කර තිබේ නම්, එම කම්කරුවාට 1973 දෙසැම්බර් මස 1 වන දින සිට මසකට රු. 180ක් වන අවම මාසික වේතන ප්‍රමාණයක් ගෙවිය යුතුය.

5. 4 වන නියෝගයේ දක්වා ඇති මාසික වේතන ප්‍රමාණයට, 1968 අංක 40 දරන සේවකයින්ගේ මුදල් අවප්‍රමාණ කිරීමේ අතුරු දීමනා පනත යටතේ ගෙවිය යුතු මුදල් අවප්‍රමාණ කිරීමේ අතුරු දීමනාව ඇතුළත් වෙතැයි සැලකිය යුතු නමුත් හදිසි අවස්ථා (පෞද්ගලික අංශයේ) විශේෂ දීමනා නියෝග යටතේ ගෙවිය යුතු පෞද්ගලික අංශයේ (විශේෂ දීමනාව) ඇතුළත් නොවන්නේය.

6. රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයෙහි යම් නුපුහුණු කම්කරුවකුට මේ නියෝග යටතේ අවම මාසික වේතන ප්‍රමාණයක් ගෙවීම, පඩි පාලක සභා ආඥපනත යටතේ පඩි පාලක සභාව විසින් කරන ලද තීරණයක් ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතුය ; ඒ අනුව එම ගෙවීම කෙරෙහි සහ එම ගෙවීම සම්බන්ධයෙන් ඒ ආඥපනතෙහි විධිවිධාන, එම විධිවිධාන පඩි පාලක සභාවක වෙනත් යම් තීරණයක් කෙරෙහි අදාළ වන ආකාරයට අදාළ විය යුතුය.

7. 1973 දෙසැම්බර් මස 1 වන දිනට පෙරාතුවම රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයෙහි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි සෑම නුපුහුණු කම්කරුවකුම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩවා සේවය කරන තාක් කල් 1973 දෙසැම්බර් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි ඔහු භුක්ති විඳිමින් සිටි, වැටුප්, දීමනා හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් වුව ද හඳුන්වනු ලබන මුදලෙන් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියමයන්ට හා කොන්දේසිවලට නොඅඩු වාසි සහිත තත්ත්වයෙන් යුත් නියමයන් හා කොන්දේසි පිට ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි යොදවනු ලැබිය යුතුය.

85A——ජී 24280—2,100 (76/12)

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල—

(අ) " කොමසාරිස් ", " කම්කරු ", " සේවායෝජක ", " වේතන " සහ " කර්මාන්තය " යන යෙදුම්වල (136 වන අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතෙහි දී ඇති අර්ථම පිළිවෙලින් ඇත්තේය ;

(ආ) " රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය " යන්නට ඒ කර්මාන්තය සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යවරයා විසින් (136 වන අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කරනු ලැබ, 1967 අගෝස්තු 25 වන දින අංක 14,763 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූවා වූ ද, 1973 මාර්තු 30 වන දින අංක 53 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙන් සංශෝධිත වූ ද ආඥාවෙහි දී ඇති අර්ථයම ඇත්තේය ;

(ඇ) " නුපුහුණු කම්කරු " යන්නට රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා පඩි පාලක සභාව විසින් කරනු ලැබ, 1971 අප්‍රේල් 29 වැනි දින අංක 14,955/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද තීරණයෙහි දී ඇති අර්ථයම ඇත්තේය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී